# බ්‍රිතාන්‍ය යුගයේ වතු වගාව හා සම්බන්ධ ප්‍රවාහන පද්ධතිය ඇසුරෙන් ඇති වූ සමාජ, ආර්ථික බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**[1]දිල්රංග පී.පී.කේ, [2]ජීවන්තක පී.වී.ඕ, [3]කල්දේරා කේ.ආර්.සී.එස්.**

සාම්ප්‍රදායික ජන ජීවිතය හා සම්බන්ධ ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකයෙන් ඔබ්බට ගොස් නිර්මාණය වූ වතු වගාවෙහි ව්‍යාප්තිය මෙරට ප්‍රවාහනය ඇරඹීමට අඩිතාලම සපයනු ලැබීය. එමගින් ඇති වූ සමාජීය හා ආර්ථික පරිවර්තනයන් හඳුනාගැනීම අධ්‍යයනයේ අරමුණ වේ. බ්‍රිතාන්‍ය වතු වගාව හා බැඳි ප්‍රවාහනය මෙරට සමාජීය හැඩගැසීමට ඍජුව ම බලපෑම් වූයේ කෙසේ ද යන්න අධ්‍යයන ගැටළුව වේ. මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ද්විතියික අධ්‍යයන ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනය සිදු කෙරිණි. මෙරට පෞද්ගලික ව්‍යවසාය දිරිමත් කිරිමට බ්‍රිතාන්‍යන් විසින් විදේශීය ආයෝජකයන් ගෙන්වාගෙන වතු ආශ්‍රිත කෝපි, තේ, පොල්, රබර්, කුරුඳු ආදිය වගා කළේය. ඒ තුළින් ඒවා අපනයනය කිරීම සඳහා ප්‍රවාහන මාධ්‍යය වැඩිදියුණු කිරීම යටත් විජිත පාලකයාට අවශ්‍ය විය. ඒත් සමග එතෙක් පැවති කරත්ත හා තවලම්වලට අමතරව දුම්රිය හා ලොරි ප්‍රවාහනයට එක් කළේය. මංමාවත් හා දුම්රිය මාර්ග නිර්මාණය කිරීමෙන් රට අභ්‍යන්තරයට ප්‍රවාහන පහසුකම් පැවතීම විදේශීය භාණ්ඩ ගම්බද ප්‍රදේශ කරා ගලා ඒමට හේතු සාධක විය. එමගින් ග්‍රාමීයන්ගේ භාණ්ඩ සඳහා අඩු ඉල්ලුමක් ලැබීම ස්වදේශික ශිල්පියා ආර්ථික වශයෙන් කඩා වැටීමේ ආරම්භය විය. එමෙන් ම විදේශීය ඇඳුම් පැළඳුම්, ආහාර පාන, ගෘහ භාණ්ඩ සඳහා ග්‍රාමීයන් නැඹුරු වීමෙන් එතෙක් පැවති සමාජ සංස්කෘතිය ක‌ෙමෙන් බටහිරකරණයට ලක් විය. එතෙක් ගැමියන් නොදැන සිටි ගිනි පෙට්ටි, භූමිතෙල්, මුළුතැන්ගෙයි භාණ්ඩ ගම්වල ව්‍යාප්ත වීම ද වතු වගාව ඔස්සේ සංවර්ධනය වූ ප්‍රවාහනයේ ප්‍රපංචයන් වේ. නගර ආශ්‍රිත බඩු බෑම, පැටවීම, කරත්ත මඟින් භාණ්ඩ ප්‍රවාහනය, මහමාර්ග මෙන් ම දුම්රිය මාර්ග තැනීම වැනි කටයුතුවලට ස්වදේශිකයන් යොදාගැනීම තුළ එතෙක් පැවති කෘෂි යැපුම් ආර්ථිකය අඩාල වී ගියේ ය. මේ ආකාරයට ප්‍රවාහන පහසුකම්වල ව්‍යාප්තියත් සමග කොළඹ, ගාල්ල වැනි නගරවලින් තවලම්වල පටවාගෙන ගෙන එන භාණ්ඩ අතර දුම්වැටියේ සිට සබන් කැටය දක්වා ග්‍රාමීය කඩපොළවල්වල හා වෙළඳ පොළවල් තුළ වෙළඳාම් සිදු විය. එමෙන් ම ප්‍රවාහන පහසුකම් වර්ධනය තුළ බ්‍රිතාන්‍යයන්ගේ තැබෑරුම්, සමාජ ශාලා, නිවාඩු නිකේතන ආදිය බිහි වූ අතර එමගින් සමාජයේ ජනයා විවිධ දුරාචාර සඳහා යොමු වීම සිදු විය. ඒ අනුව මෙරට වතු වගාව දියුණු කිරීම හා ඒවා ප්‍රවාහනය කොට අපනයනය කිරීම තුළින් ආර්ථික වාසි ලබා ගැනීමේ අරමුණින් නිර්මාණය වූ ප්‍රවාහනය ඍජුව ම මෙරට සමාජීය හා ආර්ථික පරිවර්තනයට සුවිශාල බලපෑමක් සිදු කර ඇති බව හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පද :** වතු වගාව, ප්‍රවාහනය, සමාජීය, බලපෑම, මාර්ග

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
krishmaldilranga1@gmail.com